පළාත් පාලන දෙපාර්තමේන්තුව (බස්නාහිර පළාත)
உள்ளூராட்சித்திணைக்களம்(மேல் மாகாணம்)
DEPARTMENT OF LOCAL GOVERNMENT (WESTERN PROVINCE)

අපගේ දැක්ම :- "යහපාලනයෙන් සපිරි ඵලදායී පළාත් පාලන සේවාවක්"

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனதுஇலக்கம்<br>My No. | LGD/2A/පොදු | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2020.04.21 |

නාගරික කොමසාරිස්/ලේකම්,
මහා නගර සභාව/නගර සභාව/ප්‍රාදේශීය සභාව.

**<u>අත්‍යවශ්‍ය භාණ්ඩ ප්‍රවාහනය සඳහා ඇඳිරි නීති බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධව යි.</u>**

"කොවිඩ්-19 වසංගත තත්ත්වය යටතේ එළවළු හා පළතුරු නිෂ්පාදකයින් සහ පාරිභෝගිකයින් සඳහා සහන සැලසීම" මැයෙන් සියලු පළාත් පාලන ආයතනවල නාගරික කොමසාරිස්වරුන්/ලේකම්වරුන් දැනුවත් කරමින් නිකුත් කළ මගේ සමාංක හා 2020.04.10 දාතමැති ලිපියට වැඩිමනක් වශයෙනි.

02. ඒ අනුව ඔබ ඉදිරිපත් කළ ලැයිස්තුවල සඳහන් අයවලුන් හට අත්‍යවශ්‍ය භාණ්ඩ ප්‍රවාහනය සඳහා පොලිස්පතිතුමාගේ අනුමැතිය ලැබී ඇති බැවින් හා නාමලේඛන ඉදිරිපත් කිරීමට නොහැකි වූ භාණ්ඩ ප්‍රවාහනය කිරීමට කැමැති අයවලුන් ඇති පළාත් පාලන ආයතන සඳහා ද මහා නගර සභාවකින් 04ක්, නගර සභාවකින් 03ක් හා ප්‍රාදේශීය සභාවකින් 04ක් වන පරිදි නාගරික කොමසාරිස්/ලේකම් විසින් ඔබ බලප්‍රදේශයට අයත් පොලිස් ස්ථානයෙන් ලබාගත යුතුය.

03. එකී බලපත්‍ර ලබාදීමේ දී,

i. අත්‍යවශ්‍ය මහජන සේවාවන් අඛණ්ඩව සැපයීම, මෙහෙයවීම, සම්බන්ධීකරණය හා පසුවිපරම පිණිස වූ ජනාධිපති කාර්ය සාධන බලකාය මගින් එළවළු හා පළතුරු මිලදීගන්නා ස්ථාන හා ඊට අදාළ මිලගණන් ඔබ වෙත ලබාදෙන අතර ඊට ප්‍රමුඛතාව ලබාදී කටයුතු කළයුතුය.

ii. ඉහත 03.i පරිදි ජනාධිපති කාර්ය සාධන බලකාය මැදිහත් නොවන අවස්ථාවල දී සාමාන්‍ය පරිදි එළවළු හා පළතුරු මිලදීගන්නා එක් බලප්‍රදේශයක් සඳහා උපරිම බලපත්‍ර දෙකක් පමණක් නිකුත් කළ යුතුය. (නුවරඑළිය, දඹුල්ල, කැප්පෙටිපොළ, තඹුත්තේගම, පොළොන්නරුව, මුලතිව්, හම්බන්තොට, ඇඹිලිපිටිය, බදුල්ල, බණ්ඩාරවෙල බලප්‍රදේශ ආවරණය වන පරිදි)

iii. එක් එක් පළාත් පාලන ආයතනයකින් අවම වශයෙන් එක් බලපත්‍රයක් පළතුරු ප්‍රවාහනය සඳහා නිකුත් කළයුතුය. (හම්බන්තොට, රත්නපුර, මාතලේ, අනුරාධපුර, පොළොන්නරුව දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි)

iv. භාණ්ඩ ප්‍රවාහනයෙන් අනතුරුව කුඩා ව්‍යාපාර හා ජංගම වෙළෙඳුන් සම්බන්ධ කරගනිමින් එකී භාණ්ඩ අලෙවි කළහැකිය.

v. නිකුත් කරන ලද බලපත්‍රයක් වලංගු වන්නේ එක් ගමන් වාරයක් සඳහා පමණක් වන අතර ඊළඟ ගමන් වාරය සඳහා නාගරික කොමසාරිස්/ලේකම්ගේ නිර්දේශ මත අදාළ පොලිස් ස්ථානයෙන් නව බලපත්‍රයක් ලබාගත යුතුය.

05. තව ද උද්ගතව ඇති වසංගත තත්ත්වය වැලැක්වීමේ ක්‍රියාමාර්ග ශක්තිමත් කිරීමේ හා ජනජීවිතය යථාවත් කිරීමේ අරමුණින් රටේ පවත්නා නීති රෙගුලාසිවලට බාධාවක් නොවන පරිදි මෙම කටයුතු සිදුකරන ලෙස ද කාරුණිකව දන්වා සිටිමි.

කසුන් ඇපා සෙනෙවිරත්න,
පළාත් පාලන කොමසාරිස්,
බස්නාහිර පළාත.

පිටපත් :-

| | | | |
|---|---|---|---|
| 01. | ප්‍රධානී (අත්‍යවශ්‍ය මහජන සේවාවන් අඛණ්ඩව සැපයීම, මෙහෙයවීම, සම්බන්ධීකරණය හා පසුවිපරම පිණිස වූ ජනාධිපති කාර්ය සාධන බලකාය) | - | අවශ්‍ය කටයුතු සඳහා |
| 02. | බස්නාහිර පළාත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති, ඊ.එච්.ඩබ්. දේශබන්දු තෙන්නකෝන් මහතා | - | බලපත්‍ර නිකුත් කිරීම සඳහා |
| 03. | පළාත් පාලන සහකාර කොමසාරිස් (කොළඹ/ගම්පහ/කළුතර) | - | කටයුතු අධීක්ෂණය සඳහා |


| ලිපිනය / முகவரி/Address | අංක 204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල / இல.204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுள்ள / No. 204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | පොදු<br>General | කොමසාරිස්<br>Commissioner | පාලන හා මානව සම්පත්<br>Admin / HR | නීති<br>Legal | සැලසුම්<br>Planning | ගිණුම්<br>Accounts | විමර්ශන<br>Investigation | ආයතන පරිපාලන<br>Establishment | ප්‍රජා සංවර්ධන<br>Community Development |
| | 2093156 | 2092570 | 2092574/2092576 | 2092572 | 2092571 | 2092573 | 2092580 | 2092582 | 2092583 |

| | | | | | |
|---|---|---|---|---|---|
| ෆැක්ස් / பெக்ஸ்/ Fax | 2092577 | වෙබ් ලිපිනය/ வெப்தளம்/Web | www.lgd.wpc.gov.lk | ඊමේල් /ஈமெயில்/ Email | lgd@wpc.gov.lk |